අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 420 (A)

සියළුම,
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ
අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත

<u>ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් අධිකරණ වලට අනුයුක්ත කිරීම.</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2018.05.24 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 420 සහ 2025.06.04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017 (II) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. 2018.05.24 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 420 හි 7 වන වගන්තියේ විධි විධාන අනුව අවශ්‍ය ප්‍රතිපාදන හා වියදම් ඇත්තේ නම් පමණක් (පුහුණුව ලැබීමට නියමිත අධිකරණයේ ලඝු ලේඛක/ යතුරු ලේඛක පුරප්පාඩුවක් පවතී නම් පමණක්) පුහුණුලාභියෙකුට දෛනිකව ගෙවන ලද දීමනාව, 2025.09.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු.1000/- ලෙස සංශෝධනය කරන අතර, එම චක්‍රලේඛයෙහි ඇතුළත් අනෙකුත් විධිවිධාන නොවෙනස්ව පවතී.

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2025 අගෝස්තු මස 26 දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.